# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පරීක්ෂණය (බාහිර )-2009

පළමුවන වසර

2010 ඔක්තෝබර්/නොවැම්බර්

**BCOM E 1054 – ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

01. අ. " සියළුම ගිවිසුම් එකඟත්වයන් වන අතර සියළුම එකඟත්වයන් ගිවිසුම් නොවේ. " සුදුසු නිදසුන් යොදා ගනිමින් මෙම ප්‍රකාශයෙහි ඇති වලංගුතාවය විමසන්න.

(ලකුණු 10)

ආ. අජිත් සිය ඉඩම රු. ලක්ෂ 5 කට සේනකට විකිණීම පිණිස අර්පනයක් ඉදිරිපත් කරන ලදී. සේනක අර්පනය ප්‍රතිග්‍රහණය කළ අතර ඒ සමග රු. 100,000/- වටිනාකමින් යුත් චෙක්පතක් එවූ අතර ඉතිරි මුදල රු. 50,000/- බැගින් වූ මාසික වාරික මගින් ගෙවීමට ද පොරොන්දු විය. අජිත් සහ සේනක අතර ගිවිසුමක් හට ගෙන ඇත්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. අ. ගිවිසුමක් අවසන් වීම යනු කුමක්ද ?

(ලකුණු 04)

ආ. ගිවිසුමක් අවසන් වන විවිධ ක්‍රම මොනවාද ?

(ලකුණු 16)

03. අ. " අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය " ස්ථාපිත කිරීමට සපුරාලිය යුතු කොන්දේසි මොනවාද ?

(ලකුණු 10)

ආ. i. ඩෙලිගාටස් නොන් - පොටෙස්ට් ඩෙලිගෙයාර් යන රීතියෙන් අදහස් වන්නේ කුමක්ද ?

ii. මෙම රීතියට අදාල ව්‍යාතිරේඛ මොනවාද ?

(ලකුණු 10)

04. අ. පැල සාම්පලයක් " ඉංග්‍රිසි රෝස " ලෙස හඳුන්වමින් පැලැටි තවානක අයිතිකාරිය වන රෝෂිනි විසින් වරුණිට පෙන්වන ලදී. වරුණි ඉංග්‍රිසි රෝස පැල 500 ක් ඇණවුම් කළාය. පැල තවානේ අයිතිකාරිය වන රෝෂිනී එම පැල වරුණිට සැපයූ අතර ඒවා සාම්පලයට සමාන වුවද ඒවා " ශ්‍රී ලංකා රෝස " පැල විය. මෙම ගිවිසුමේ පාර්ශවයන්ගේ නීතිමය තත්වය විනිශ්චිත නඩු ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ආ. භාණ්ඩ විකිණීමේ නීතියේ දැක්වෙන ආකාරයට " භාණ්ඩ භාර දීම " යන්න නිර්වචනය කරන්න. භාණ්ඩ භාරදීමට අදාල රීති මොනවා දැයි සැකවින් දක්වන්න.

(ලකුණු 12)

05. අ. " අපරානුමැතිය මත නියෝජ්‍යත්වය " යනුවෙන් කුමක් අදහස් වේද ? වලංගු අපරානුමැතියක් උදෙසා සපුරාලිය යුතු අවශ්‍යතාවයන් මොනවාද ?

(ලකුණු 10)

ආ. නියෝජිතයෙකු සතු සත්‍ය බලය සහ දෘශ්‍යමාන වන බලය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06. අ. සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රතිපල කවරේද ?

(ලකුණු 06)

ආ. සමාගමක් ලියාපදිංචි කිරීම උදෙසා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන මොනවාද ?

(ලකුණු 06)

ඇ. 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව සමාගමක අධ්‍යක්ෂවරුන් වෙත පැවරෙන්නාවූ කාර්යභාරය කුමක්දැයි දක්වන්න.

(ලකුණු 08)

07. අ. හවුල් ව්‍යාපාර කටයුතු වලට අදාලව හවුල්කරුවෙකු සතු ව්‍යාංග බලතල මොනවාද ?

(ලකුණු 10)

ආ. කෙටි සටහන් ලියන්න.

i. ආදේශනය පිළිබඳ මූලධර්මය
ii. රක්ෂණ ගිවිසුමක් සහ ආරක්ෂණ ගිවිසුමක් අතර ඇති වෙනස්කම්

(ලකුණු 10)